ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2020 මැයි 01 |

**ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට පත් ව්‍යාපාර හා පුද්ගලයන් හට සහන ලබා ගැනීම සඳහා අයදුම් කිරීමට ලබාදී තිබූ කාල සීමා දීර්ඝ කරයි.**

කොරෝනා වසංගතය හේතුවෙන් මූල්‍ය ආයතනයන්ගේ ඇතැම් ගනුදෙනුකරුවන් විසින් මුහුණපා ඇති දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් ගනුදෙනුකරුවන් හට ණය සහන සහ 4% වාර්ෂික පොළී අනුපාතය යටතේ මාස දෙකක කාරක ප්‍රාග්ධන ණය පහසුකම් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමේ (2020 අප්‍රේල් 30 වැනි දිනට යෙදී තිබූ) අවසාන දිනය 2020 මැයි15 දින දක්වා දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කර ඇත. එමෙන්ම, රුපියල් 500,000ට වඩා අඩු වටිනාකමින් යුතු වලංගු කාලය ඉක්මගොස් ඇති චෙක්පත්, බලපත්‍රලාභී බැංකු විසින් 2020 මැයි15 දින දක්වා වලංගු සේ සැලකිය යුතු වේ. මෙම කාල සීමා දීර්ඝ කිරීම 2020 අප්‍රේල් 28 වැනි දින නිකුත් කරන ලද 2020 අංක 06 දරණ චක්‍රලේඛය මගින් ක්‍රියාත්මක කර ඇත.

ණය සහන ලබා ගැනීමට සුදුසුකම් ලබන ව්‍යාපාර හා පුද්ගලයන් ඊට අදාළ තොරතුරු/ලේඛන කල් වේලා ඇතිව සිය බැංකු වෙත ලබාදීම අවශ්‍ය වේ මෙම සහන අනුව, අදාළ සුදුසුකම් ලබන ගනුදෙනුකරුවන්ගේ ණය පහසුකම් වල ආපසු ගෙවීමේ කාලය, ණය සහන කාලසීමාවෙන් දීර්ඝ කිරීමට බැංකු විසින් කටයුතු කල යුතුය. එබැවින්, මෙම දීර්ඝකල කාලසීමාව, අමතර පිරිවැයකින් තොරව තම ණය පහසුකම් පියවා දැමීම සඳහා අවස්ථාවක් කරගන්නා ලෙස ගනුදෙනුකරුවන්ගෙන් ඉල්ලා සිටින අතර එමගින් බැංකු හටද සිය ද්‍රවශීලතා තත්ත්වයන් ශක්තිමත් කරගැනීමට හැකියාව ලැබෙනු ඇත.